# අපේ ගෙදරට ආ අලුත් යාළුවෝ



විනුදි නෙසංගා චන්ද්‍රසේකර

# අපේ ගෙදරට ආ අලුත් යාළුවෝ

**විනුදි නෙසංගා චන්ද්‍රසේකර**

**කතෘ**

**පළමු දිගහැරීම**

**මහාමායා බාලිකා විද්‍යාලය**

**1 - E**

**2025-02-08**

**ISBN 978-624-208-373-5**

# පිදුම

මගේ

දෙමාපියන්ට

හා

ගුරුවරුන්ට

ආදරයෙන්

පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරුදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙෂ එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

අපේ ගෙදර හරිම හුරතල් පුස් පැටියෙක් හිටියා.

එයාගේ නම රෝසි



මම එයාට ගොඩාක් අදරෙයි.

විවේක වෙලාවට මම එයත් එක්ක සෙල්ලම් කරනවා.



එයත් මාගෙත් එක්ක සෙල්ලම් කරන්න හරි කැමතියි.

## කිරි බොන්නත් එයා හරිම කැමතියි.



## මගේ ගාව දැවටි දැවැටි ඉන්නත් රෝසි හරීම ආසයි.



**මම බත් කනකොට එයා බත් කන්න දුවගෙන එනවා.**



ටික දවසක ඉඳලා රෝසි හරිම කම්මැලි කමේ ඉන්නේ.

හැම තිස්සෙම නිදාගන්නවා.



මම හිතුවා එයාට ලෙඩක් හැදිලා කියලා

මට හරිම දුකයි.   !!!

මමත් වෙනදා වගේ පුරුදු විදිහට ඉස්කෝලේ ගියා.

එයා ගැන වැඩිපුර බලන්න වෙලාවක් තිබුනෙත් නෑ

ඔහොම සති කිහිපයක් ගෙවුනා . . . . . . . . . . . . . . . . . . . . . .



මම දවසක් දැක්කා අම්මා කුස්සියේ වැඩ කරනකොට

මාළු කෑල්ලක් උස්සගෙන රෝසි දුවනවා.

මම හොරෙන් බලාගෙන හිටියා.

මම තවත් දවසක දැක්කා



මේසේ උඩ තිබුනු බනිස් ගෙඩියක් කටින් උස්සගෙන රෝසි යනවා.

කොහෙටද මෙ කැම ගෙනියන්නෙ

මට හරි පුදුම හිතුණා. !!!

මම හොරෙන් හොරෙන් එයාගේ පස්සේන්

යන්ට පටන් ගත්තා.



එයා බනිස් ගෙඩිය උස්සගෙන ගියේ ගබඩාකාමරෙට

මම හිමිට ජනේලෙන් එබිලා බැලුවා.

මට හරි පුදුමයි!!!



චූටි පූස් පැටව් හතර දෙනෙක් කෑගහනවා. හරිම සද්දෙන් කෑගහනවා.

එයාලා පුළුන් වැඩක් වගේ හරි ලස්සනයි.

මට ආදරේ හිතුනා!!!

එයා කෑම ගෙනියන්නේ එයාගෙ පැටවුන්ට

එයා කොච්චර ආදරේද දරුවන්ට කියලා මට එදා හිතුනා .

අපේ අම්මා මට ආදරේ වගේ පූස් පැටව් එයාගේ පැටවුන්ට ගොඩක් ආදරෙයි.

අපේ දෙමව්පියන් අපිට ආදරෙයි වගේම

සතුනුත් එයාගෙ දරුවන්ට ගොඩක් ආදරෙයි කියලා එදා මට හිතුනා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ එලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ
සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

**ISBN 978-624-208-373-5**